## කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව

### බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ වැඩ/ ක්ෂේත්‍ර කම්කරු III පුරප්පාඩු පිරවීම

කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී ඇති වැඩ / ක්ෂේත්‍ර කම්කරු III තනතුරට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ. (කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය ඇති අයදුම්කරුවන්ට හා දැනටමත් තාවකාලික, අනියම් හා ආදේශක සේවයේ නියුතු අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.)

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් සම්පූර්ණ කර "ලේකම්, කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව, ගොතටුව නව නගරය" යන ලිපිනයට 2019.10.11 දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන සහ වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | වැඩ/ක්ෂේත්‍ර කම්කරු III ශ්‍රේණිය | 04 | PL 1 - 2016 රු. 24,250 - 10x250 - 10x270 - 10x300 - 12x330 - 36,410 (4 වැනි වැටුප් පියවරට පෙර කාර්‍යක්ෂමතා කඩඉමකි.) | 8 වන ශ්‍රේණිය (9 වසර) සමත් ව තිබිය යුතුය. |

02. *බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි .-*

(1) අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

(2) මානසික යෝග්‍යතාවයකින් හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශරීර සෞඛ්‍යකින් යුක්ත විය යුතුය.

අයදුම්කරු බස්නාහිර පළාත තුළ අයදුම්පත් භාර ගන්නා දිනට පූර්වාසන්න වසර 03ක කාලයක් ස්ථිර පදිංචිකරුවකු විය යුතුය.

(3) අයදුම්පත් භාරගන්නා දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුය. (රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවකයකු සම්බන්ධයෙන් උපරිම වයස් කාණ්ඩ බලනොපානු ඇත.)

(4) සේවා අවශ්‍යතාවය අනුව විධිමත් සම්මුඛ පරීක්ෂණයන් මගින් සුදුස්සන් තෝරනු ලැබේ.

03. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි .-*

(1) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. බඳවාගනු ලබන සේවකයින් වැන්දඹු/ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය.

(2) පත්වීම් අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වේ.

(3) මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තු නියෝගවලට ද, බස්නාහිර පළාත් සභාවේ හෝ බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හෝ කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව විසින් වරින්වර නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලට ද, අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.

04. සුදුසුකම් ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර අයදුම්පත් සමග පහත සඳහන් ලියකියවිලිවල සහතික කළ පිටපත් එවිය යුතුය. සම්මුඛ පරීක්ෂණයේ දී මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය .-

(1) උප්පැන්න සහතිකය;

(2) අධ්‍යාපන සහතික;

(3) අදාළ කාල සීමාව සඳහා පදිංචිය සනාථ කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කරන ලද ග්‍රාම නිලධාරි සහතිකය;

(4) මෑතක දී ලබා ගත් චරිත සහතික 02ක්;

(5) සේවා පළපුරුද්ද පිළිබඳ සහතික;

(6) වෙනත් සුදුසුකම් දැක්වෙන සහතික.

05. *අයදුම් කළ යුතු ආකාරය .-*

(1) මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතිය පරිදි (A4 ප්‍රමාණයේ) අයදුම්පත් 2019.10.11 වැනි දිනට පෙර "ලේකම්, කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව, ගොතටුව නව නගරය" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

(2) අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාළ තනතුර සඳහන් කළ යුතුය.

(3) දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ අයදුම්පත් තම ආයතන ප්‍රධානියාගේ නිර්දේශයන් සහිතව එවිය යුතුය.

(4) අතින් ගෙනැවිත් භාර දෙන අයදුම්පත් භාර ගනු නොලබන අතර, ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**සැලකිය යුතුයි .-** මෙම අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර කාල සීමාවේ දී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

ජේ. චාන්දනී ඒකනායක,
ලේකම්,
කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව.

2019 සැප්තැම්බර් මස 17 වැනි දින,
ගොතටුව මුල්ලේරියාව නව නගරය,
කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව***

*බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ .......................................... තනතුර සඳහා අයදුම්පත*

01. (අ) මුලකුරු සමග නම :————————————.

(ආ) මුලකුරුවලින් හැඳින්වෙන නම :————————————.

02. (අ) ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————————————.

(ආ) ස්ථිර පදිංචි ලිපිනය :————————————.

03. දුරකථන අංකය : පෞද්ගලික :————————————. නිවස :————————————

04. ස්ත්‍රී/පුරුෂ භාවය :————————————.

05. (අ) උපන් දිනය : වර්ෂය —————. මාසය —————. දිනය —————.

(ආ) අයදුම්පත් භාරගන්නා 2019.10.11 දිනට වයස : අවුරුදු:—————. මාස:—————. දින:—————.

06. ජාතික හැඳුනුම්පත් අංකය:————————————.

07. විවාහක/අවිවාහක තත්වය :————————————.

08. අධ්‍යාපන සුදුසුකම්:————————————.

8.1 අයදුම්කරුවන් අවසන් වරට සමත් වූ පන්තිය :————————————.

8.2 අ.පො.ස. (සා.පෙළ) :

I. වර්ෂය :————————————. මාසය :————————————.

II. විභාග අංකය :————————————.

III. ප්‍රතිඵල :————————————.

| විෂය | සාමාර්ථය | විෂය | සාමාර්ථය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

8.3 අ.පො.ස. (උසස් පෙළ) :

I. වර්ෂය :————————————. මාසය :————————————.
II. විභාග අංකය :————————————.
III. ප්‍රතිඵල :————————————.

| විෂය | සාමාර්ථය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |
| 5. | |

09. වෘත්තීය සුදුසුකම් හා සේවා පළපුරුද්ද :————————————.

වෙනත් සුදුසුකම් : ————————————.

10. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරුවකු කරනු ලැබ තිබේද?/නැත්ද? යන වග :————————————

11. දැනට ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතු නම් ඒ පිළිබඳ විස්තර :

(අ) දැනට දරන තනතුර :————————————.

(ආ) එම තනතුරට පත් වූ දිනය :————————————.

(ඇ) එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/ආදේශක/ව්‍යාපෘති යන වග) : ————————————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දක්වා ඇති බව ඔප්පු වුවහොත්, පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

————————————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————————

**ආයතන ප්‍රධානියාගේ සහතිකය**

**(රාජ්‍ය සේවයේ / පළාත් රාජ්‍ය සේවයේ/ රජයේ සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා)**

මෙම අයදුම්කරු වන .................................................................................................. මයා/මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ ..........................................................වශයෙන් සේවය කරයි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් සේවයෙන් නිදහස් කළ හැක. /නොහැක. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කරමි. / නොකරමි.

————————————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :————————————.
පදවි නාමය :————————————.
(නිල මුද්‍රාව යොදන්න)
දිනය :————————————.

09-999/1